# රුහුණ විශ්වවිද්‍යාලය

## පුරප්පාඩු

මෙම විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින පහත තනතුරු සඳහා සුදුසුකම් ඇති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ, විශ්වවිද්‍යාලවල හා ඊට අනුබද්ධිත අනෙකුත් උසස් අධ්‍යාපන ආයතනවල සේවය තහවුරු කරන ලද ස්ථිර සේවක භවතුන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

### 01. ප්‍රධාන ශිෂ්‍ය විනය පාලක

**සුදුසුකම් :**

i. විශ්වවිද්‍යාල විනයාරක්ෂක සේවාවේ නියෝජ්‍ය ශිෂ්‍ය විනය පාලක තනතුරක් දැරූ , එම තනතුරට ස්ථිරව පත්වූ සහ එම තනතුරෙහි වසර පහක් (05) හෝ වැඩි කාලයක් සතුටුදායක සේවයක් ඉටු කළ පුද්ගලයෙකු විය යුතුය.

ශාරීරික සුදුසුකම් :

උස අඩි 5 අඟල් 5 ට නොඅඩු විය යුතුය
පපුව අඟල් 32 (නොඅඩු) ක් විය යුතුය

සටහන : විශ්වවිද්‍යාලය තුළ සහ ජාතික මට්ටමින් ක්‍රීඩා කටයුතු, සමාජ සුභසාධන කටයුතු සහ විනෝදාත්මක වැඩසටහන් සඳහා ක්‍රියාකාරීව සහභාගී වූවන්ට ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

හෝ

ii. ශ්‍රී ලංකා සන්නද්ධ හමුදා බලකාවල ලුතිනන් කර්නල් නිළධාරියෙකු හෝ ශ්‍රී ලංකා පොලිසියේ ඒ හා සමාන තනතුරක් දරන නිළධාරියෙකු සහ ක්‍රීඩා ක්‍රියාකාරකම් සඳහා සක්‍රිය සහභාගීත්වයක් දක්වා තිබීම.

**වැටුප් පරිමාණය** : U EX 2 (II) – Rs.113,690 - 8 x 2,400; 8 x 2,940 - 156,410 මාසික (2027.01.01 දින සිට)

**බඳවා ගැනීම** : සම්මුඛ පරීක්ෂණයක් මඟින්

### 02. ප්‍රධාන ආරක්ෂක නිළධාරී (II ශ්‍රේණිය)

**සුදුසුකම් :**

i. සහකාර පොලිස් අධිකාරී තනතුරට වඩා අඩු නොවන නිලධාරියෙකු, යුද හමුදා කපිතාන්වරයෙකු හෝ අනෙකුත් සන්නද්ධ සේවාවන්හි ඒ හා සමාන තනතුරක නිලධාරියෙකු වීම.

හෝ

ii. පිළිගත් විශ්වවිද්‍යාලයකින් / උසස් අධ්‍යාපන ආයතනයකින් උපාධියක් ලබා ඇති සහ ආරක්ෂක කටයුතු පිළිබඳ අවම වශයෙන් වසර පහක (05) සේවා පළපුරුද්දක් ඇති පුද්ගලයෙකු වීම.

හෝ

iii. විශ්වවිද්‍යාල ආරක්ෂක සේවාවේ ආරක්ෂක පරීක්ෂක (Security Inspector) (I ශ්‍රේණිය) හෝ ඉහළ තනතුරක් දැරූ , එම තනතුරට ස්ථිරව පත්වූ සහ එම ශ්‍රේණිවල වසර අටක් (08) හෝ ඊට වැඩි කාලයක් සතුටුදායක සේවයක් ඉටු කළ පුද්ගලයෙකු විය යුතුය.

**වැටුප් පරිමාණය** : U EX 1(II) - රු 85,305 – 3 x 2020; 91,365 (EB) 93,765; 12 X 2400 – 122,565 මාසික (2027.01.01 දින සිට)

**බඳවා ගැනීම** : සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

## 03. පූර්ණකාලීන උප ශාලාධිපති (II ශ්‍රේණිය)

සුදුසුකම් :

i. රජයේ පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධිධාරියෙක් විය යුතුය. නේවාසිකාගාර පරිපාලනය හා කළමණාකරනය පිළිබඳව පලපුරුද්ද ඇති අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

වැටුප් පරිමාණය : U MN 3(II) –රු 71,365 – 18 X 1,190– 92,785 මාසික (2027.01.01 දින සිට)

බඳවා ගැනීම : සම්මුඛ පරීක්ෂණයක් මගින්.

## 04. විගණන සහකාර (II ශ්‍රේණිය)

සුදුසුකම් :

i. අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගයේදී

- සිංහල භාෂාව/දෙමළ භාෂාව
- ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍යය
- ගණිතය

යන විෂයයන්ට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06ක් එක් වරකදී සමත් වී තිබීම.

සහ

ii. අ.පො.ස උසස් පෙළ විභාගයේදී එක් වරකදී සාමාන්‍ය පොදු පරීක්ෂණ ප්‍රශ්න පත්‍රය හැර) සියලු විෂයයන් සමත්ව තිබීම.(පැරණි විෂය නිර්දේශය යටතේ එක් වරකදී විෂයයන් තුනක් සමත්ව තිබීම ප්‍රමාණවත් වේ.)

සහ

iii. තනතුර සඳහා විශේෂිත සුදුසුකම්

(අ). ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ (CA) ප්‍රාථමික අදියර/විධායක අදියර/ CAB I/පදනම් අදියර සමත්වී තිබීම .

හෝ

(ආ). ශ්‍රී ලංකා වරලත් කළමනාකාරිත්ව ගණකාධිකරණ (CIMA) ආයතනයේ පදනම් අදියර සමත් වීම.

හෝ

(ඇ). ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ ගණකාධිකරණය (SLIATE) පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව (HNDA) සමත් වී තිබීම.

හෝ

(ඈ). ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ(AAT) සාමාජිකත්වය ලබා තිබීම.

සහ

iv. රජයේ හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක වසර දෙකක (02) විගණන ක්ෂේත්‍රයේ පළපුරුද්ද ලබා තිබීම.

පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අය කෙරෙහි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

- පිළිගත් ආයතනයකින් ලබා ගත් මාස 06කට නොඅඩු පිළිගත හැකි පරිගණක යෙදුම් පාඨමාලාවක් හදාරා තිබීම.

සටහන : අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයේ/රාජ්‍ය අංශයේ /පිළිගත් පෞද්ගලික සංවිධානයන් හි ගණකාධිකරණ/විගණන ක්ෂේත්‍රයේ පළපුරුද්ද ඉහත (iv) හි සඳහන් විගණන ක්ෂේත්‍රයේ පළපුරුද්ද වෙනුවෙන් සලකා බලනු ඇත.

වැටුප් පරිමාණය : U MN 2(II) – රු Rs 61,275 – 18 X 890 – 77,295 මාසික (2027.01.01 දින සිට)

බඳවා ගැනීම : සම්මුඛ පරීක්ෂණයක් මගින්.

## 05. කළමනාකරණ සහකාර (ගබඩා භාරකරු) (III ශ්‍රේණිය)

සුදුසුකම් :

i. අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගයේදී

- සිංහල භාෂාව/දෙමළ භාෂාව
- ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍යය
- ගණිතය

යන විෂයන්ට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06ක් එක් වරකදී සමත් වී තිබීම.

සහ

ii. අ.පො.ස උසස් පෙළ විභාගයේදී එක් වරකදි ( සාමාන්‍ය පොදු පරීක්ෂණ ප්‍රශ්න පත්‍රය හැර) සියලු විෂයයන් සමත්ව තිබීම

සහ

iii. තනතුර සඳහා විශේෂිත සුදුසුකම්
ගබඩාකරණය පිළිබඳ වසරක පළපුරුද්ද සහිතව අ.පො.ස. (සා.පෙළ) විභාගයේ වාණිජ්‍ය විෂයය සමත්වීම හෝ අ.පො.ස. (උ.පෙළ) විභාගයේ ගිණුම්කරණය විෂය සමත්වීම.

පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අය කෙරෙහි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

(අ) පිළිගත් ආයතනයකින් ලබා ගත් මාස 06කට නොඅඩු පිළිගත හැකි පරිගණක යෙදුම් පාඨමාලාවක් හදාරා තිබීම.

සහ

(ආ) පරිගණක යෙදුම් පැකේජ භාවිතය පිළිබඳ වසර 02 ක පළපුරුද්ද

සටහන: විශ්වවිද්‍යාලය විසින් තීරණය කරනු ලබන පරිදි ආරක්ෂක තැන්පතුවක් ඉදිරිපත් කළ යුතුය.

වැටුප් පරිමාණය : U-MN 1(III) රු. 49,475-17×540 – 58,655 මාසික (2027.01.01 දින සිට)

බඳවා ගැනීම : ලිඛිත පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින්

## 06.තාක්ෂණික නිළධාරී (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ - (III ශ්‍රේණිය)

සුදුසුකම් :

i. අ.පො.ස උසස් පෙළ විභාගයෙහි ඕනෑම විෂයය ධාරාවන් යටතේ එක් වරකදී විෂයන් තුනක් (03) සමත් වී තිබිය යුතුය.

සහ

ii. තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික/ වෘත්තිය පුහුණු ආයතනයකින් හෝ තොරතුරු හා සන්නිවේදන හා බහුමාධ්‍ය තාක්ෂණය/ තොරතුරු තාක්ෂණය යන ක්ෂේත්‍රයකට අදාළව පිළිගත් ආයතනයකින් හෝ නිකුත් කරනු ලැබූ ජාතික වෘත්තිය නිපුනතා 5 වන මට්ටම (N.V.Q. Level 05) නොඅඩු නිපුනතා සහතිකපත් හෝ වෙනත් සමාන සුදුසුකමක් ලබා තිබීම.

සටහන : තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයේ පළපුරුද්දක් ඇති අය සඳහා ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

වැටුප් පරිමාණය : U MT 1(III) – රු 51,095 – 7 X 540; 10 X 640 – 60,575 මාසික (2027.01.01 දින සිට)

බඳවා ගැනීම : ලිඛිත පරීක්ෂණයක් හා/ හෝ ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින්.

## 07.විදුලි කාර්මික (III ශ්‍රේණිය)

සුදුසුකම් :

i. ප්‍රාථමික මට්ටමේ අර්ධ පුහුණු (U-PL 2) හෝ නුපුහුණු (U-PL 1) තනතුරක සේවය කරන වර්තමාන තනතුරේ තහවුරු කර තිබීම හා ඉහත තනතුරේ කාර්යයට අදාළ තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/වෘත්තිය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තිය සුදුසුකම් (NVQ) 4 වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

හෝ

ii. ප්‍රාථමික මට්ටමේ අර්ධ පුහුණු (U-PL 2) හෝ නුපුහුණු (U-PL 1) තනතුරක සේවය කරන වර්තමාන තනතුරේ තහවුරු කර තිබීම හා ඉහත තනතුරේ කාර්යයට අදාල ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර පහක (05) සේවා පළපුරුද්දක් සමග ඉහත තනතුරේ කාර්යයට අදාළ ජාතික වෘත්තිය සුදුසුකම් (NVQ) මට්ටම 2 ට නොඅඩු ප්‍රවීණතාවක් ලබා ඇති බව වෘත්තිය පරීක්ෂණයකින් සනාථ කර තිබීම.

වැටුප් පරිමාණය : UPL 3 (III) –රු 48,005 – 16 X 490 ;55,845 මාසික (2027.01.01 දින සිට)

බඳවා ගැනීම : වෘත්තිය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගින්

## 08.රියදුරු (III ශ්‍රේණිය)

සුදුසුකම් :

i. බර වාහන පැදවීම සම්බන්ධව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද රියදුරු බලපත්‍රයක් තිබිය යුතු අතර රියදුරු බලපත්‍රයක් ලබාගැනීමෙන් පසුව අවම වශයෙන් වසර තුනක (03) පළපුරුද්දක් ලබා තිබිය යුතුය.

සහ

ii. ප්‍රාථමික මට්ටමේ අර්ධ පුහුණු (U-PL 2) හෝ නුපුහුණු (U-PL 1) තනතුරක සේවය කරන වර්තමාන තනතුරේ තහවුරු කර තිබීම සහ අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සහිත සේවකයෙකු වීම.

වැටුප් පරිමාණය : UPL 3 (III) –රු 48,005 – 16 X 490 ;55,845 මාසික (2027.01.01 දින සිට)

බඳවා ගැනීම : වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගින්.

## 09.විද්‍යාගාර සහායක (III ශ්‍රේණිය)

සුදුසුකම්

i. ප්‍රාථමික මට්ටමේ නුපුහුණු තනතුරක (U-PL 1) සේවය කරන වර්තමාන තනතුරේ තහවුරු කර තිබීම හා අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) සමත්වී තිබීම සහ ඉහත තනතුරේ කාර්යයට අදාළ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 2 හෝ 3 වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

හෝ

ii. ප්‍රාථමික මට්ටමේ නුපුහුණු තනතුරක (U-PL 1) සේවය කරන වර්තමාන තනතුරේ තහවුරු කර තිබීම හා අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව දෙවරකට නොවැඩි නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) සමත්වී තිබීම සහ අදාළ ක්ෂේත්‍රයේ කාර්මික කුසලතා සමග වසරක (01) පළපුරුද්දක් ලබා තිබීම.

හෝ

iii. ප්‍රාථමික මට්ටමේ නුපුහුණු තනතුරක (U-PL 1) සේවය කරන වර්තමාන තනතුරේ තහවුරු කර තිබීම හා තනතුරට අදාළ ක්ෂේත්‍රයේ කාර්මික කුසලතා සමග අවම වශයෙන් වසර පහක (05) පළපුරුද්දක් ලබා තිබීම.

වැටුප් පරිමාණය : UPL 2 (III) –රු 44,575 – 16 X 490 ;52,415 මාසික (2027.01.01 දින සිට)

බඳවා ගැනීම : වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගින්

## 10.උපස්ථායක (සෞඛ්‍ය සේවා) - කාන්තා (III ශ්‍රේණිය )

**සුදුසුකම්**

i. ප්‍රාථමික මට්ටමේ නුපුහුණු තනතුරක (U-PL 1) සේවය කරන වර්තමාන තනතුරේ තහවුරු කර තිබීම හා අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) සමත්වී තිබීම සහ ඉහත තනතුරේ කාර්යයට අදාල තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 2 හෝ 3 වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

හෝ

ii. ප්‍රාථමික මට්ටමේ නුපුහුණු තනතුරක (U-PL 1) සේවය කරන වර්තමාන තනතුරේ තහවුරු කර තිබීම හා අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) සමත්වී තිබීම සහ අදාළ ක්ෂේත්‍රයේ කාර්මික කුසලතා සමග වසරක (01) පළපුරුද්දක් ලබා තිබීම.

හෝ

iii. ප්‍රාථමික මට්ටමේ නුපුහුණු තනතුරක (U-PL 1) සේවය කරන වර්තමාන තනතුරේ තහවුරු කර තිබීම හා තනතුරට අදාළ ක්ෂේත්‍රයේ කාර්මික කුසලතා සමග අවම වශයෙන් වසර පහක (05) පළපුරුද්දක් ලබා තිබීම.

වැටුප් පරිමාණය : UPL 2 (III) –රු 44,575 – 16 X 490 ;52,415 මාසික (2027.01.01 දින සිට)

බඳවා ගැනීම : වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගින්

**වෙනත් කරුණු**

ඉහත සියලු තනතුරු සඳහා රජය විසින් අනුමත කරන ලද අනෙකුත් දීමනාද ගෙවනු ලබන අතර, වැටුප කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 6/2025 සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 2/2025 (i) හි සඳහන් උපදෙස් අනුව ගෙවනු ලැබේ.

**අයදුම්පත් ක්‍රියාවලිය**

1. සියලුම අයදුම්කරුවන් ප්‍රථමයෙන් මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ පමණක් 2025.08.29 දිනට පෙර අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අතර, මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා https://application.ruh.ac.lk/ වෙබ් අඩවිය වෙත පිවිස ලබා දී ඇති උපදෙස් අනුව අයදුම්පත ඉදිරිපත් කළ යුතුය. 2025.08.14 දින සිට මෙම අයදුම්පත් මාර්ගගත ක්‍රමවේදය මත පිරවිය හැකි අතර 2025.08.29 වන දින සවස 4.00 ට අවසන් වේ.

2. මෙයට අමතරව බාගත කරන ලද අයදුම්පතක්ද තමා සේවය කරන ආයතනයේ ලේකම්/ලේඛකාධිකාරී මගින් 2025.08.29 වන දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් "නියෝජ්‍ය ලේඛකාධිකාරී, අනධ්‍යයන ආයතන අංශය, රුහුණ විශ්වවිද්‍යාලය, වැල්ලමඩම, මාතර" යන ලිපිනයට යොමු කළ යුතුය.

3. අවශ්‍ය විස්තර සඳහන් නොකිරීම, සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ සහතිකවල ඡායා පිටපත් අමුණා නොතිබීම සහ අයදුම්පත් නියමිත දිනට පසුව ලැබීම හෝ වෙනයම් අවශ්‍යතාවයක් සපුරා නොතිබීම අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතු වේ. කිසියම් අයදුම්පතක් ප්‍රතික්ෂේප කළ විට කුමන හේතුවක් නිසා හෝ යලි සළකා බලනු නොලැබේ.

ලේඛකාධිකාරි
රුහුණ විශ්වවිද්‍යාලය
මාතර.

වැඩ බලන ලේඛකාධිකාරී
රුහුණ විශ්වවිද්‍යාලය
2025.08.13